Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

6 ශ්‍රේණිය — තෙවන වාර පරීක්ෂණය - 2024 — 33 S I

නම: ..........................................  **ඉතිහාසය**  කාලය පැය දෙකයි

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **පහත සඳහන් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉරි මත ලියන්න.**

01) ක්‍රි.ව. 5 වන සියවසේ දී රචනා කළ මහාවංශයේ කතුවරයා වැඩ වාසය කළ පිරිවෙන ........................................ යි.

02) මීට අවුරුදු මිලියන දෙක හමාරකට පෙර පෘතුවියේ පැවැති අධික ශීතල දේශගුණය සහිත කාලය ............................ යුගය ලෙස හඳුන්වයි.

03) මිනිසා පළමු වරට ගින්දර භාවිත කළ බවට සාක්ෂි ................................ සොයාගෙන තිබේ.

04) වසභ රජු ...................................... රාජවංශයට අයත් වේ.

05) ජේතවන ස්තූපයේ බුදුරජාණන් වහන්සේගේ ...................................... නිධන් කොට ඇත.

(දකුණු අකු ධාතුව, ජලයිස්ටොසින භූ අවධිය, දික්සඳ සෙනෙවියා පිරිවෙන, පටිධාතුව, ඊශ්‍රායලයෙන්, අප්‍රිකාවෙන්, නායක්කර්, මහාහිම, ලම්බකර්ණ, සුනේත්‍රාදේවි)

- **පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් වරහන තුළ ( ✔ ) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද යොදන්න.**

06) මිනිසුන් ආගමික කටයුතු වලට නැඹුරු වීම පළමු වරට පිළිබිඹු වන්නේ නවශිලා යුගයේදී ය. ( )

07) නගරයක් අසල පළමුවරට වැවක් ඉදිකරන ලද්දේ පණ්ඩුකාභය රජතුමා ය. ( )

08) වළගම්බා රජු විසින් භික්ෂූන් වහන්සේලාට දානය වැළඳීම සඳහා ලහබත්ගේ නමින් දානශාලාවක් ඉදිකොට ඇත. ( )

09) මළ සිරුරු කල්තබා ගැනීමේ මමීකරණ ක්‍රමය ලෝකයට හඳුන්වා දෙන ලද්දේ ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ වැසියන් ය ( )

10) සංඝමිත්තා මෙහෙණින් වහන්සේ විසින් ශ්‍රී මහා බෝධීන් වහන්සේ රැගත් නැව පැමිණියේ දඹකොලපටුන වරායට ය ( )

- **පහත සඳහන් ප්‍රශ්නවලට ගැලපෙන නිවැරදි පිළිතුරු දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

11) ක්‍රි:ව: හතරවන සියවසේ දී රචනා වූ සාහිත්‍ය මූලාශ්‍රයකි
1. මහාවංශය  2. දීපවංශය  3. ථූපවංශය  4. චූලාවංශය

12) විජය කුමරු ඇතුළු පිරිස මෙරටට ගොඩ බට වරාය ලෙස සැළකෙන්නේ,
1. ගොඩවාය  2. දඹකොළපටුන  3. තම්බපණ්ණිය  4. ලංකාපටුන

13) ධාතුසේන රජතුමාගේ පියා ලෙස සැලකෙන්නේ,
1. දාඨානාම  2. කාවන්තිස්ස  3. මොග්ගල්ලාන  4. මුටසීව

14) මිනිසා මුල්වරට ගම්මාන තනා ගත්තේ ක්‍රි.පූ.,
1. 3000  2. 2400  3. 6000  4. 550



iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskole

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

15) පළමු වරට රබර් බෝලයක් සාදන ලද්දේ,
1. මායා ශිෂ්ටාචාර වැසියන්
2. ඊජිප්තු ශිෂ්ටාචාර වැසියන්
3. ඉන්දු නිම්න ශිෂ්ටාචාර වැසියන්
4. චීන ශිෂ්ටාචාර වැසියන්

**• අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට අදාළ පිළිතුරු හිස්තැන් මත ලියන්න.**

16) පාරාවෝ රජවරුන්ගේ මළ සිරුරු තැන්පත් කරන ලද්දේ ............................................ ය.

17) පණ්ඩුකාභය රජුගේ බිසව ............................................ කුමරිය යි.

18) වලගම්බා රජුට කරදරවල පැටලී සිටින විට උදව් කළ ............................................ භික්ෂූන් වහන්සේට අභයගිරිය විහාරය පූජා කොට ඇත.

19) මෙසොපොතේමියානු ශිෂ්ටාචාරයේ පුදපූජා පැවැත් වූ දේවාල ............................................ ලෙස හඳුන්වා ඇත.

20) ශ්‍රී ලංකාවේ බුදු දහම වැළඳගත් පළමුවන පාලකයා ............................................ රජතුමා ය.

(ල.20x2=40)

## II කොටස

**• පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.**
**• පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**


01) (අ) පහත ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු ලියා දක්වන්න.

i. මහසෙන් රජු විසින් ඉදිකරනු ලැබූ පහත සඳහන් වැව් හැඳින්වූ පැරණි නාමය ලියන්න.
a. හුරුළු වැව -
b. කනදරා වැව -

ii. වසභ රජු විසින් ඉදිකරන ලද පහත වැව්වල නූතන නාමය ලියා දක්වන්න.
a. මයෙන්ති වැව -
b. වාතමංගණ වැව - (ල.04)


(ආ) පහත දැක්වෙන සිතියම ආධාර කරගෙන A, B, C, D අක්ෂරවලින් දැක්වෙන රටවල් මොනවාදැයි ලියා දක්වන්න.

A-
B-
C-
D-




(ල.04)

(ඇ) පහත පින්තූර අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A


i. A. A පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක් ද?
B. මෙය පිහිටුවා ඇති ස්ථානය කුමක් ද?
C. මේවායේ ජීවත් වී ඇත්තේ කුමන යුගයේ මානවයින් ද?
D. මෙම යුගයේ මානවයින් ආහාරයට ගත් ශාකමය ආහාර වර්ගයක් ලියා දක්වන්න. (ල.04)

B


ii. A. B පින්තූරයෙන් පිළිබිඹු වන්නේ කුමක් ද?
B. මේවා නිපදවා ඇත්තේ කවුරුන් විසින් ද?
C. මේවායේ සඳහන්ව ඇත්තේ කුමන කටයුතුවලට අදාළ විස්තර ද?
D. මෙම යුගයේ ගිල්ගමේෂ් නැමැත්තා ලියන ලද ලෝකයේ පැරණිම කෘතිය කුමක් ද? (ල.04)



iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskole

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

02) i. නවශිලා යුගයේ සතුන් හීලෑ කරගැනීම දැකිය හැකි ප්‍රධාන ආර්ථික කටයුත්තකි. සතුන්ගෙන් ඔවුන් ලබාගත් දේවල් තුනක් ලියන්න. (ල.03)

ii. මධ්‍යශිලා යුගයේ දියුණු වූ මානවයාගේ මානව ක්‍රියාකාරකම් දෙකක් ලියන්න. (ල.04)

iii. නූතන මානවයා ප්‍රධාන වශයෙන් වර්ග 04 කට බෙදා දක්වා ඇත. එම වර්ග මොනවාදැයි ලියා දක්වන්න. (ල.04)

03) i. ශිෂ්ටාචාරයක දැකිය හැකි මූලික ලක්ෂණ 03 ක් ලියන්න. (ල.03)

ii. මෙසපොතේමියානු සමාජයේ ජීවත් වූ පූජකයන් හඳුනාගත හැකි ලක්ෂණ 04 ක් ලියන්න. (ල.04)

iii. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය ඇසුරින් පහත වගුව පුරවන්න. (ල.04)

| වර්තමානයේ එම ප්‍රදේශයට අයත් රටවල් | ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ප්‍රධාන නගර |
|---|---|
| A.<br>B. | C.<br>D. |

04) i. මිහිඳු මහරහතන් වහන්සේ සමඟ මෙරටට වැඩි රහතන් වහන්සේලා තුන් නමක් ලියා දක්වන්න. (ල.03)

ii. දේවානම්පියතිස්ස රජුගේ ආගමික සේවා දෙකක් ලියා දක්වන්න. (ල.04)

iii. දුටුගැමුණු රජුගේ සේනාපතිවරු හතරදෙනෙක් ලියා දක්වන්න. (ල.04)

05) i. වළගම්බා රජුගේ සහෝදරයින් තිදෙනා කවුරුන් ද? (ල.03)

ii. වළගම්බා රාජ්‍ය සමය ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න. (ල.04)

| | |
|---|---|
| 1. ........................................................ | මාතලේ අලු විහාරය |
| අභයගිරි ස්ථූපය විශාල කිරීම | 2. ........................................................ |
| 3. ........................................................ | සතුරන් ඉදිරියට ගිය තැන සිහිවීම |
| වසර ගණනාවක් වර්ෂාව නොලැබීම | 4. ........................................................ |

iii. දුටුගැමුණු රජුගේ චරිතයෙන් ගතහැකි ආදර්ශ 04 ක් ලියන්න. (ල.04)

06) i. විජය කුමරු මෙරටට ගොඩබට අවධියේ මෙරට ජීවත් වූ බවට විශ්වාස කරන ගෝත්‍රික කණ්ඩායම් 03 නම් කරන්න. (ල.03)

ii. ගොවිතැනට යොමු වූ අපේ පැරණි ජනතාව ගෙවල්වල වහල සෙවිලි කිරීමට භාවිතා කළ ද්‍රව්‍ය දෙකක් ලියන්න. (ල.04)


iii. ගොවියුගයේ මානවයා තම නෑදැයින් මියගිය පසු ඉටුකරන ලද චාරිත්‍ර මොනවාද ? ඉන් 02 ක් සඳහන් කරන්න. (ල.04)

07) i. මෙසපොතේමියානු වැසියන් දෙවියන් ලෙස සලකා වැඳුම් පිදුම් කළ ස්වභාවික වස්තු 03 ක් නම් කරන්න. (ල.03)

ii. පුරාවිද්‍යාත්මක සාක්ෂි හමුවන ඉන්දු නිම්නයට අයත් නගර හතරක් ලියා දක්වන්න. (ල.04)

iii. පහත පින්තූර කුමන ශිෂ්ටාචාර යුගයට අයත්දැයි A,B,C,D අනුපිළිවෙලින් ලියා දක්වන්න. (ල.04)


A


B


C


D



iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskole

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## ඉතිහාසය - 6 ශ්‍රේණිය
## පිළිතුරු පත්‍රය

01) දික්සද සෙනෙවියා 02) මහාහිම 03) ඊශ්‍රාලය 04) ලම්බකර්ණ 05) පට්ධාතුව 06) ✔ 07) ✔ 08) x 09) x
10) ✔ 11) දීපවංශය 12) තම්බපණ්ණිය 13) දුය්‍යානාම 14) 6000 15) මායා ශිෂ්ටාචාරයට අයත් වැසියන් 16) පිරමීඩ 17) ස්වර්ණපාලි
18) කුපික්කලතිස්ස 19) සිගුරට් 20) දේවානම්පියතිස්ස (ල.40)

## II කොටස

01) (අ) i. A. වල්ලුවාපී / ජල්ලුරවාපී B. චාන්‍ද වාපී
ii. A. මහවිලච්චිය B. නොච්චිපොතාන

(ආ) A. ඉන්දියාව B. චීනය C. අප්‍රිකාව D. ඕස්ට්‍රේලියාව

(ඇ) A. i. ගල්ගුහාවක් ii. කිතුල්ගල බෙලිලෙන iii. දඩයම් යුගයේ iv. වල්දෙල්, වල් කෙසෙල්
B. i. ලෝකයේ පැරණිම අක්ෂර පද්ධතිය ii. මෙසපොතේමියානු වැසියන් iii. වෙළදාම් කටයුතු iv. වීර කතාව

02) i. කිරි, මස්, ලොම්, බිත්තර
ii. • නිවාස තනා ගැනීම • ගල්පර්වත බිත්ති මත චිත්‍ර ඇඳීම • එක තැනක දිගු කලක් ජීවත් වීම
iii. කොකසොයිඩ්, නීග්‍රොයිඩ්, ඔස්ට්‍රලොයිඩ් මොන්ගොලොයිඩ්

03) i. නගර බිහිවීම, නගර පාලනයට පිරිස් සිටීම, ආගමික ස්ථාන ඉදිකිරීම, වෙළදාම් කිරීම
ii. • ආගමික කටයුතු වල නිරත වීම • වෛද්‍යවරු සේවය කිරීම • පූජකවරු හිස මුඩු කිරීම • බැටළු සම් වලින් මැසූ කබායක් හැද සිටීම
iii. A ඇෆ්ගනිස්ථානය B පකිස්ථානය C මොහෙන්ජොදරෝ D හරප්පා

04) i. ඉට්ඨිය, උත්තිය, සම්බල, බද්ධශාල
ii. • ථූපාරාමය ඉදි කිරීම • තිස්සමහාරාමය නම් පන්සලක් ඉදිකි5ම • ශ්‍රී මහා බෝධීන් වහන්සේ රෝපණය
iii. නන්දිමිත්‍ර සූරනිමල, මහාසෝණ, ථෙරපුත්තාභය

05) i. ථූලත්තන, ලජ්ජතිස්ස, නාග
ii. 1. මාතලේ අළුවිහාරය 2. පළවෙනි ගජබාහු 3. සෝමාරාමය 4. බැමිණිතියාසාය
iii. • රටට ආගමට හිතවත් වීම • ගරු කල යුත්තන්ට ගරු කිරීම • රටවැසියාට ආදරය කිරීම • ධෛර්යවන්තභාවය • බුද්ධිමත්බාවය

06) i. යක්ෂ, නාග, දේව
ii. මානා, ඉලුක්
iii. • මළ සිරුරු වැලලීම • ඇට සැකිලි ගොඩගෙන ආදාහනය • මිණිඅළු මැටි මුට්ටිවල දමා සොහොනක වැලලීම • සොහොන් තැනීම

07) i. වර්ෂාව, සුළඟ, ගංවතුර
ii. මොහෙන්ජොදාරෝ, හරප්පා, ධොලවීර, කාලිබන්ගන්
iii. A මෙසපොතේමියානු B ඉන්දුනිම්න C ඊජිප්තු D ඊජිප්තු



iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskole